# 多言語情報コーナー　　　　　　　　　　（令和８年　１月号）

## 1. 2026 මූල්‍ය වර්ෂය සඳහා නාගරික සහ ප්‍රාන්ත බදු ගැලපීම් කිරීම සඳහා දැන්වීම

ජපානයේ, ඔබ යම් සමාගමක සේවය කරන්නේ නම්, ආදායම් බද්ද ස්වයංක්‍රීයව ඔබේ මාසික වැටුපෙන් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත්, මෙම මුදල දළ ඇස්තමේන්තුවක් පමණක් වන අතර එය නිවැරදි නොවේ. වසර අවසානයේදී, දෙසැම්බර් මාසයේදී, ඔබේ සමාගම ඔබේ නිවැරදි බදු මුදල ගණනය කිරීම සඳහා ඔබේ වාර්ෂික ආදායම, පවුලේ තත්ත්වය සහ රක්ෂණ වාරික වැනි තොරතුරු එකතුකර සකසනු ලබන බදු ගණනය කිරීම "වසර අවසාන බදු ගැලපීම" ලෙස හැඳින්වේ. ඔබ ඔබේ මාසික බදු වැඩිපුර ගෙවා ඇත්නම්, ඔබට මුදල් ආපසු ගෙවීමක් කරනු ඇත. ඔබ ප්‍රමාණවත් මුදලක් ගෙවා නොමැති නම්, ඔබට අමතර බදු ගෙවීමට සිදුවනු ඇත. බොහෝ දෙනෙකුට කුඩා මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවීමක් ලෙස ලැබෙනු ඇත.

ආදායම් බදු යනු රජයේ බදු අදායම වන අතර ඊට අමතරව, "නාගරික බදු සහ ප්‍රාන්ත බදු" වශයෙන්ද ඇත, ඒවා ඔබ ජීවත් වන නගරයට හෝ ප්‍රාන්තයට ගෙවන බදු වේ. මෙම "නාගරික සහ ප්‍රාන්ත බදු" තීරණය වන්නේ පසුගිය වසරේ ඔබේ අදායම අනුව වන අතර එම අදායමට අදාල බදු ඊළඟ වසරේ ඒවා ගෙවනු ඇත.
බොහෝ අවස්ථාවලදී, බදු ගැලපීමක් ගොනු කිරීම අවශ්‍ය නොවේ. මෙයට හේතුව ඔබේ සමාගම ඔබේ වසර අවසාන බදු ගැලපුම සිදු කරන්නේ නම්, ඔබේ වැටුප් තොරතුරු නගර ශාලාවට යවනු ලැබේ. කෙසේ වෙතත්, ඔබේ සමාගම ඔබේ වසර අවසාන බදු ගැලපුම සිදු නොකරන්නේ නම්, හෝ ඔබට ආදායමක් නොමැති නම් සහ බදු නිදහස් කිරීමේ සහතිකයක් අවශ්‍ය නම්, ඔබට නගර ශාලාවේදී ඔබේ බදු ප්‍රතිලාභය ගැලපීම් ගොනු කළ යුතුය.

මෙම වසරේ බදු ප්‍රතිලාභ ගොනුකිරීම් ඉදිරිපත් කිරීමේ කාලය පෙබරවාරි 16 වැනිදා සිට මාර්තු 16 වැනිදා දක්වා වන අතර, සෙනසුරාදා, ඉරිදා සහ නිවාඩු දින හැර. බදු ගොනු කිරීම සඳහා ඒ සඳහා වෙන්කර ඇති දුරකථන මගින් ස්ථානය, දිනය සහ වේලාව තීරණය කල යුතු වේ. ඒ සඳහා දුරකථනය මගින් ලබාදෙන හඬ මාර්ගෝපදේශය අනුගමනය කරන්න.

වෙන්කර ගැනීමේ කාලය වන්නේ ජනවාරි මස 20 වැනිදා සිට මාර්තු මස 15 වැනිදා දක්වා වෙන් කිරීම් ලබාගනු ලැබේ. ඔබ කැමති දිනයට පෙර දින දක්වා වෙන් කිරීම් කළ හැකිය. ඔබට දුරකථනය මගින් දිනයක් වෙන්කිරීමේදී එදිනම වෙන් කිරීම් කළ නොහැක. ඔබට ජපන් භාෂාව තේරෙන්නේ නැත්නම්, කරුණාකර එය තේරුම් ගන්නා කෙනෙකුගෙන් සහය ලබාගන්න.

## 2. ඔබට වයස අවුරුදු 20 වන විට ජාතික විශ්‍රාම වැටුප හා සම්බන්දවීම පිලිබදව

ජපානයේ, ඔබ වයස අවුරුදු 20 වන විට ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වේ. විදේශිකයන්ද ජපානයේ පදිංචිකරුවන් ලෙස ලියාපදිංචි වී ඇත්නම් එම පුද්ගලයින්ද මෙම ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වේ. මෙහිදී ජාතිකත්වය නොසලකා ඇතුලත් වනු ඇත.ඔබ කිසියම් සමාගමක සේවක විශ්‍රාම වැටුප් රක්ෂණයට ඇතුළත් වී නොමැති නම් එවැනි ඕනෑම කෙනෙකුට මේ සඳහා ලියාපදිංචි විය හැකිය.

ඔබට වයස අවුරුදු 20 වන විට,  ජපන් විශ්‍රාම වැටුප් සේවයෙන් මූලික විශ්‍රාම වැටුප් අංක දැනුම්දීමක් සහ ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික ගෙවීමේ පත්‍රිකාවක් ලැබෙනු ඇත. ඔබ සෑම මසකම ඔබේ ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික ගෙවිය යුතු අතර 2025 මූල්‍ය වර්ෂය සඳහා මාසික වාරිකය යෙන් 17,510 වනු ලැබේ.

සිසුන්ට සහ ආදායමක් නොමැති අයට ඔවුන්ගේ වාරික ගෙවීමට අපහසු නම්, නිදහස් කිරීමක් හෝ කල් දැමීමක් සිදුකළහැකි අතර නිදහස් කිරීමක් සඳහා අයදුම් කිරීමට ඔබට අවශ්‍ය නම් කරුණාකර තොචිගි විශ්‍රාම වැටුප් කාර්යාලයට හෝ නගර ශාලාවේ ප්‍රධාන කාර්යාලයේ දෙවන මහලේ රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශයේ හෝ ඕනෑම ශාඛා කාර්යාලයක ප්‍රජා සංවර්ධන ප්‍රවර්ධන අංශයේ ඒ සඳහා ඇති අවශ්‍ය ක්‍රියා පටිපාටි සම්පූර්ණ කරන්න.

ජාතික විශ්‍රාම වැටුපට සම්බන්ධ වීමෙන් ප්‍රතිලාභ තුනක් තිබේ.

1. ඔබ වයසට ගිය විට, ඔබට මූලික මහලු වියේ විශ්‍රාම වැටුපක් ලැබෙනු ඇත.
2. අසනීප හෝ තුවාල හේතුවෙන් ඔබ ආබාධිත වුවහොත්, ඔබට මූලික ආබාධිත විශ්‍රාම වැටුපක් ලැබෙනු ඇත.
3. ඔබ මිය ගියහොත්, ඔබගේ පවුලට මූලික දිවි ගලවා ගත් අයගේ විශ්‍රාම වැටුපක් ලැබෙනු ඇත.

ඊට අමතරව, ඔබ ඔබේ මව් රටට ආපසු යාමකදී ඔබට එකවර මුදල් ආපසු ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබිය හැකිය.

විදේශීය ජාතිකයෙකු තම විශ්‍රාම වැටුප් දායක මුදල් නොගෙවන්නේ නම්, එය ඔවුන්ගේ පදිංචි තත්ත්වයට බලපානු ඇත. පදිංචි තත්ත්වය වෙනස් කිරීම හෝ අලුත් කිරීම සඳහා අවසර දීම වළක්වන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. ඊට අමතරව, ස්ථිර පදිංචිය සඳහා අයදුම් කරන විට, පසුගිය වසර දෙක සඳහා ඔබේ විශ්‍රාම වැටුප් ගෙවීම් තත්ත්වය දැඩි ලෙස පරීක්ෂා කරනු ලැබේ. ගෙවීම් නොකළ හෝ නිදහස් කිරීමේ කාල පරිච්ඡේද තිබේ නම්, ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට ඉහළ හැකියාවක් ඇත, එබැවින් ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වී ගෙවීමට වග බලා ගන්න.

## 3. මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත් වෙත මාරුවීම පිළිබඳව (2024 දෙසැම්බර් කලාපයෙන් නැවත මතක් කිරීම)

මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත යනු ඔබගේ මයි නම්බර් කාඩ්පත ඔබේ "සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත" ලෙස ක්‍රියා කරන පද්ධතියකි. ඒවා රෝහල්, දන්ත වෛද්‍යවරුන් සහ ෆාමසිවල භාවිතා කළ හැකිය. පදිංචිය සහතික කරන කාඩ්පතක් සහ මයි නම්බර් කාඩ්පතක් ඇති විදේශීය ජාතිකයින් ද මේ සඳහා සුදුසුකම් ලබයි.

2024 දෙසැම්බර් 2 වන දින වන විට, සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත් නිකුත් කිරීම අවසන් වී ඇති අතර, අපි මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත් මත පදනම් වූ පද්ධතියකට මාරු වී ඇත්තෙමු. නමුත් ටික කලකට, මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පතක් නොමැතිව වුවද ඔබේ පෙර සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත තවමත් වලංගු විය .

කෙසේ වෙතත්, 2025 දෙසැම්බර් 2 වන දින වන විට, පෙර කඩදාසි සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත තවදුරටත් වලංගු නොවේ.

ඔබට තවමත් මයි නම්බර් කාඩ්පතක් නොමැති නම්, හෝ ඔබට මයි නම්බර් කාඩ්පතක් ඇති නමුත් එය ඔබේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ලෙස ලියාපදිංචි කර නොමැති නම්, ඔබට "සුදුසුකම් තහවුරු කිරීමේ සහතිකය" නමින් කාඩ්පතක් ලැබී තිබිය යුතුය. රෝහලේදී, ඔබේ මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත හෝ ඔබේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ලෙස ක්‍රියා කරන "සුදුසුකම් තහවුරු කිරීමේ සහතිකය" ඉදිරිපත් කරන්න.

කෙසේ වෙතත්, අනාගතයේදී, මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත පමණක් භාවිතා වනු ඇත. ඔබට ඔබේ නගර ශාලාවේදී මයි නම්බර් කාඩ්පතක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, එය සූදානම් වූ පසු, ඔබට එය ඔබේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ලෙස ලියාපදිංචි කළ හැකිය. පළමු වරට ලියාපදිංචි වීමට, ඔබේ මයි නම්බර් කාඩ්පත රෝහලක හෝ ෆාමසියක කාඩ්පතභාවිතා කරන යන්ත්‍රයට ඇතුලත් කිරීමෙන් මුහුණු හඳුනාගැනීම හෝ ඉලක්කම් හතරක රහස්‍ය අංකයක භාවිතයෙන් ඔබේ අනන්‍යතාවය සහතික කර, තොරතුරු සැපයීමට එකඟ වීමෙන් රක්ෂණ කාඩ්පත ලෙස භාවිතා කල හැක.

තවද,මෙය පෙර භාවිතා කල සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත් මෙන් "මාසයකට වරක්" තොරතුරු සැපයීම වෙනුවට, ඔබ වෛද්‍යවරයා හමුවීමට යන සෑම අවස්ථාවකම ඔබේ මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ඔබ රැගෙන ආ යුතු අතර, ඔබේ අනන්‍යතාවය සහතික කිරීමට සහ කාඩ්පත් කියවන යන්ත්‍රය භාවිතා කරන සෑම අවස්ථාවකම තොරතුරු සැපයීමට එකඟ වීමට ඔබට අවශ්‍ය වනු ඇත.